# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2101/35 – 2018 දෙසැම්බර් 14 වැනි සිකුරාදා – 2018.12.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/21/02/2009.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

අංක 2073/47 දරන හා 2018.06.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 02, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත (යුනියන් පෙදෙස), අංක 457 හි පිහිටි සමස්ත ලංකා වෙළෙඳ හා කර්මාන්ත කම්කරු සංගමය හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 248 හි පිහිටි ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පීඑල්සී අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක ඒ 3511 දරන හා 2018.05.02 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පීඑල්සී වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක ඒ 3511 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මකවීම 2019.06.01 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 දෙසැම්බර් මස 03 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 29090 – 13 (2018/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

**'අ' ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

*ලිපිනය :* කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු මහලේකම් කාර්යාලය,
කම්කරු දෙපාර්තමේන්තුව, නාරාහේන්පිට,
කොළඹ 05.

*දිනය :* 2018.07.12

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2018.06.01 දිනැති අංක 2073/47 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, සමස්ත ලංකා වෙළෙඳ හා කර්මාන්ත කම්කරු සංගමය සහ ගෙස්ටෙටිනර් ඔෆ් සිලෝන් පීඑල්සී බැඳී සිටින්නාවූ ද 2018.05.02 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

බී. සී. යූ. පෙරේරා
කළමනාකාර අධ්‍යක්ෂ,
ගෙස්ටෙටිනර් ඔෆ් සිලෝන් පීඑල්සී

*පිටපත -*
ප්‍රධාන ලේකම්,
457, දොස්තර කොල්වින් ආර්. ද සිල්වා මාවත,
(යුනියන් පෙදෙස),
කොළඹ 02.

12 – 870

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.